**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ වෙන්කිරීම් සිදුකර නොතිබීම නිසා 2023 වර්ෂයේදී ණයහිමියන්ට ගෙවූ රු.38,860ක් එම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් ගිණුමෙන් ගලපන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | යන්ත්‍ර අලුත්වැඩියා වියදම් රු.969,366ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | - එම - | -එම - |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | වර්ෂ 02 ඉක්මවූ රු.1,731,530ක තැන්පතු 91ක් නිරවුල් කර නොතිබුණු අතර ආදායමට ගත යුතු රු.248,500ක් වූ තැන්පතු 05ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | මුදල් රෙගුලාසි අනුව වසර 02 ඉක්ම වූ පසු සියලු මුදල් ආදායමට ගැනීමට ප්‍රාදේශීය සභාවකට නොහැකි බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 02/2010 දරන චක්‍රලේඛයේ 4(xiii) ඡේදය | වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වරිපනම් දේපළ, වසර 15කින් සිදුකර නොතිබුණි. | ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහායවීමේ කමිටුව මඟින් 2024 වර්ෂයේ සිට නව තක්සේරුව පිළිගැනීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති 03/2020 චක්‍රලේඛයේ<br>-------------------- | | | |
| (i) | 14 ඡේදය | මස් මාළු වෙළඳසැල් සඳහා වාර්ෂික අවම ලංසු මුදල වසර 03 කට වරක් තක්සේරු කර නොතිබුණි. | දේපළ 07ක් සඳහා තක්සේරු වාර්තා මේ වන විට ලැබී ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | 4 හා 5 ඡේදය | දෙහිඕවිට නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 ක් සඳහා කුලී පිළිබඳ කොන්දේසි සහිතව ගිවිසුම්ගත වී නොතිබීමෙන් ඇප තැන්පත්, හිඟ කුලී හා දඩ ලෙස රු.1,947,364 ක් අයකරගත නොහැකි වී තිබුණි. | හිඟ මුදල් 2024.06.30 වන විට ගෙවා අවසන් කිරීමට දන්වා ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,726,381 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,639,872 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,118,000 | 4,370,619 | 4,942,471 | 3,499,921 | 4,573,000 | 4,783,327 | 4,906,095 | 3,969,913 |
| කුලී | 14,218,660 | 14,868,896 | 14,984,474 | 5,581,456 | 13,410,400 | 12,733,800 | 11,956,293 | 5,893,625 |
| බලපත්‍ර ගාස්තු | 1,017,200 | 1,184,111 | 1,146,111 | - | 505,200 | 435,548 | 463,548 | - |
| වෙනත් ආදායම් | 9,003,600 | 11,379,281 | 10,807,170 | 861,193 | 6,403,800 | 9,003,177 | 8,014,503 | 1,039,357 |
| | 28,357,460 | 31,802,907 | 31,880,226 | 9,942,570 | 24,892,400 | 26,955,852 | 25,340,439 | 10,902,895 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මස් කඩ 03 කින් හා මාළු පිලකින් 1991 වර්ෂයේ සිට 1997 වර්ෂය දක්වා කාලය සඳහා ලැබිය යුතු කඩකුලී හා දඩ රු.94,281ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත යොමුකර තිබුණි. | පිළිගනිමි. | හිඟ ආදායම් නොපමාව අයකළ යුතු වීම. |
| (ආ) | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දේපළ 06 ක් බදු දීමට නොහැකි වීමෙන් රු.5,945,873 ක ඇස්තමේන්තුගත ආදායමක් අහිමි වී තිබුණි. | ලංසු කැඳවන ලද නමුත් ලංසු ඉදිරිපත් නොවූ බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු.1,848,514 ක් වූ අතර, එම ශේෂය තුළ වසර 01 ක් ඉක්මවූ රු.1,262,558ක ශේෂයක් විය. | වරිපනම් බදු නොගෙවූ දේපළ සඳහා තහනම් නිවේදන යොමු කර 2024 ජනවාරි මාසයේදී දේපළ තහනම් වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. | හිඟ ආදායම් නොපමාව රැස් කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,650,445 ක් වූ හිඟ අක්කර බදු ශේෂයෙන් වසර 05ක් ඉක්මවා ඇති අයවිය යුතු ශේෂය රු. 1,218,601 ක් විය. | පවතින හිඟය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,339,706 ක් වූ කඩකාමර කුලී හිඟ ශේෂයෙන් වසර 01 ක් ඉක්මවූ රු.4,586,236 ක ශේෂ විය. | හිඟ මුදල් 2024 ජුනි 30 වන විට ගෙවා අවසන් කිරීමට දන්වා ඇති බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.308,322 ක් වූ කඩ කුලී හිඟ ශේෂය තුළ වසර 01 ක් ඉක්ම වූ ශේෂය රු.258,622 ක් විය. | -එම- | -එම-. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිරවුල් නොකළ රු.158,225 ක හර ශේෂයක් 2018 වසරේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | ශේෂය නිරවුල් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දීගලවත්ත ජල ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදි කළ ළිඳේ ජලය පානය කිරීමට නුසුදුසු වූයෙන් එම ඉදි කිරීම වෙනුවෙන් 2022 අගෝස්තු මාසයේ ගෙවිය යුතු රු. 687,231 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහාය වීමේ කමිටුව වෙත ගෙවීම් තීරණ ගැනීම සඳහා යොමු කර ඇති බව. | පොදු තැන්පත් ගිණුමේ වූ ශේෂ නිරවුල් කළ යුතු වේ. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු 3,912,081ක ශේෂය තුළ වසර 01 ත් වසර 03 ත් අතර පවතින රු.225,719 ක ශේෂද වසර 05 ට වඩා පැරණි රු.437,585 ක ශේෂ විය. | 2024 ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව කාල විශ්ලේෂණ ඉදිරිපත් කරන බව. | ශේෂ නිරවුල් කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.803,000 වැයකර ඉදිකළ මාදොල හෙළ බොජුන්හලේ ඉදිකිරීම් නිම වී මාස 06 ක් ගත වී තිබුණ ද, මේ දක්වාම අභාවිතව පවතී. | එය විවෘත කිරීමට කටයුතු කරමින් පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු රු.802,200ක මුද්දර බදු තැන්පත් ශේෂයෙන් රු.691,752 ක් වර්ෂ 2015 - 2016 අතර කාලයක් පැරණි විය. | අදාළ ශේෂ තහවුරු කරගෙන නිරවුල් කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු.587,284 ක් වූ වයිබ්රේටි රෝල මාස 6 කට අධික කාලයක් සිට අභාවිතව පවතී. | මේ දිනවල සංවර්ධන කටයුතු සඳහා ඉල්ලුමක් නොමැති වීම හා අලුත්වැඩියා පිරිවැය අධික වීම නිසා මෙය අභාවිතව පවතින බව. | අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුවේ. |
| (ආ) | 2015 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද රු.2,594,995 ක් වූ කම්පැක්ටර් ටේලරය ලද දින සිටම අභාවිතව රථ ගාලක් තුළ දිරාපත් වෙමින් පවතී. | කම්පැක්ටර් රථයට කසල වෙන්කර එකතු කළ නොහැකි වීම හා ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත ධාවනය කිරීමේ අපහසුතාව නිසා භාවිතයට නොගනී. | වත්කම් අභාවිතව නොතැබිය යුතුවේ. |
| (ඇ) | රු.3,000,000 ක් වූ ගිලන් රථය පවරා ගෙන නොතිබුණි. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් කර ඇති බව. | පවරා ගැනිමට කටයුතු කළ යුතුවේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත 60 දෙනෙකුගේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 26 ක් විය. සේවා ගිවිසුම් මත තනතුරු 24 ක් ද, 09 දෙනෙකු දරන්නාට පෞද්ගලික වන සේ ද අනුමත කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් සේවා ගිවිසුම් මත හා දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු අනුමත කර ඇති බව . | සේවක පුරප්පාඩු අනුමත කරගෙන පිරවීමට කටයුතු කළ යුතුවේ. |